www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විදුලිබල කම්කරුවෝ වැටුප් වැඩිවීම ඉල්ලා වර්ජනය කරති

## Sri Lankan power workers strike for pay increase

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**

**2009 අගෝස්තු 31**

**ලං**කා විදුලි බල මන්ඩලයේ (ලංවිම) දහස් ගනනක් කම්කරුවෝ සියයට 40 ක වැටුප් වැඩිවීමක්, සේවා කොන්දේසි යලි ස්ථාපිත කිරීම සහ මේ වසරේ මුල දී සම්මත කල විදුලිබල පනත අවලංගු කරන ලෙස ඉල්ලා පසුගිය සිකුරාදා ජාතික පරිමාන එක් දින වර්ජනයක නිරත වූහ.

වර්ජනය කඩාකප්පල් කිරීමේ උත්සාහයක් ලෙස සියලුම විදුලිබල සේවකයන්ගේ නිවාඩු අවලංගු කල ආන්ඩුව වර්ජනයයේ යෙදෙන ඕනෑම කෙනෙකුට විරුද්ධව "දැඩි පියවර" ගන්නා බවට තර්ජනය කලේ ය. එහෙත්, ලිපිකරුවන්, කාර්මිකයන්, විදුලි කාර්මිකයන්, ප්‍රවාහන සේවකයන්, තාක්ෂනික ශිල්පීන් සහ මනු කියවන්නන් ඇතුලු 14,000 ක ශක්තිමත් ශ්‍රම බලකායෙන් සියයට 70 කට අධික සංඛ්‍යාවක් වර්ජනයට සහභාගි වූහ. කාර්යාල සහ ක්ෂේත්‍ර කටයුතු පවත්වාගෙන යාම සඳහා පාලනාධිකාරය කොන්ත්‍රාත් සහ පරිවාස කම්කරුවන් යොදා ගත්තේය.

වර්ජනය තුල ඉහල සහභාගිත්වය ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවේ ආර්ථික පිලිවෙත්වලට එරෙහිව සමස්තයක් ලෙස කම්කරු පන්තිය තුල වර්ධනය වන අතෘප්තියේ තවත් සලකුනකි. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධයේ දැවැන්ත වියදම සහ දැන් ලෝක ආර්ථික පසුබෑස්ම මගින් උග්‍ර කෙරී ඇති අර්බුදයේ බර වැඩ කරන ජනතාව මත පැටවීමේ උත්සාහයක ආන්ඩුව නිරතව සිටින්නේය.

ඉහත ඉල්ලීම් මතම ලංවිම කම්කරුවෝ ජුලි 17 දා ලෙඩ නිවාඩු දැමීමේ උද්ඝෝෂනයක යෙදුනහ. ඉන් පසුව ඔවුහු අනුරාධපුරය, කුරුනෑගල, කල්මුනේ, ගාල්ල සහ අවසානයේ දී පසුගිය සතියේ බදාදා කොලඹ දී පිකට් උද්ඝෝෂන පැවැත් වූහ. වර්ජනයට සහභාගි වූ සංඛ්‍යාව ලෙඩ නිවාඩු දැමීමේ උද්ඝෝෂනයට සම්බන්ධ වූ සංඛ්‍යාවට වඩා බොහෝසෙයින් වැඩිය.

වර්ජනය කැඳවුම් කරනු ලැබුවේ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) සම්බන්ධ ලංකා විදුලි සේවක සංගමයේ (ලංවිසේසං) මූලිකත්වයෙන් යුතු වෘත්තීය සමිති 27ක සන්ධානයක් වන වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුන (වෘසඒපෙ) විසින් ය. නව සමසමාජ පක්ෂය (නසසප)ට සම්බන්ධ බිල්පත් නිලධාරින්ගේ සංගමය (බිනිසං) සහ තාක්ෂනික ශිල්පීන්ගේ සංගමය (තාශිසං) ද වර්ජනයට එකතු වූහ. තමන්ට ආරාධනය කර නොතිබූ බවට දුබල තර්කයක් ඉදිරිපත් කරමින් මෙම සමිති දෙක කලින් පැවැති වර්ජනයට සම්බන්ධ නොවූහ.

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය සහ ඉංජිනේරු සංගමය ඇතුලු ආන්ඩුවට ගැති වෘත්තීය සමිති එකතුව (වෘසඑ) වර්ජනයෙන් ඉවත්ව සිටියේ ය. එහෙත් ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමහරක් වර්ජනයට සම්බන්ධ වීම වැලැක්වීමට ඔවුහු අසමත් වූහ.

කෙසේ නමුත්, වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුන වර්ජනය සීමා කිරීමට උත්සාහ කලේ ය. උද්ඝෝෂනයේ ඊලඟ පියවරයන් ගැන සාකච්ඡා කිරීම සඳහා වෘත්තීය සමිති සන්ධානය වැඩ පොල මට්ටමේ පිකට් කිරීම් හෝ රැස්වීම් සංවිධානය නොකලේ ය. වර්ජනය දවසේ ගෙවල්වලට වී සිටින ලෙස වෘත්තීය සමිති කම්කරුවන්ට උපදෙස් දුන්හ. එය රාජපක්ෂ ආන්ඩුව සමග ගැටුමක් ඇතිවීම වැලැක්වීම සඳහා පැහැදිලිව ම සැලසුම් කල පියවරකි. "දැවැන්ත යුද වියදම සහ ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම" උපුටා දක්වමින් විදුලිබල සහ බලශක්ති ඇමති ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න පසුගිය සතියේ දී වෘත්තීය සමිති ඉල්ලීම මුලුමනින් ම ප්‍රතික්ෂේ කලේ ය. කම්කරුවන් වර්ජනය කලොත් "ඔවුන්ට විරුද්ධව ආන්ඩුව දැඩි පියවර" ගන්නා බවට ඔහු කම්කරුවන්ට තර්ජනය කලේ ය.

වාර්ෂික ආරක්ෂක වියදම රුපියල් බිලියන 166 කට වඩා ඉහල දමමින් ආන්ඩුව පසුගිය වසර තුන තුල බෙදුම්වාදී එල්ටීටීඊයට එරෙහි යුද්ධය තීව්‍ර කලේ ය. මැයි මාසයේ දී එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව ආන්ඩුව වහාම කම්කරු පන්තියේ සහ ගම්බද දුගීන්ගේ සමාජ කොන්දේසි තව දුරටත් කාබාසිනියා කරන "ජාතිය ගොඩනැගීමේ ආර්ථික යුද්ධය" නිවේදනය කලේ ය.

මාර්තු මාසයේ දී ආන්ඩුව පුද්ගලීකරනයට පාර කපන විදුලිබල පනත සම්මත කලේ ය. පනත පැහැදිලිව ම, ලංවිම වැනි පාඩු ලබන රාජ්‍ය ආයතන සඳහා දෙනු ලබන සහනාධාර ආන්ඩුව අහෝසි කල යුතු බවට කොන්දේසි පැන වූ ඩොලර් බිලියන 2.6 නයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගැනීම සඳහා පෙර සූදානමකි. විශේෂයෙන්ම "ලංකා විදුලි බල මන්ඩලය සහ ලංකා

ඛනිජ තෙල් සංස්ථාව 2011 වන විට සිය ආදායමෙන් යැපෙන තත්ත්වයකට" ගෙන ආ යුතු බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශ කලේ ය.

ලංවිම විශාල වශයෙන් පාඩු ලබන රාජ්‍ය ආයතනවලින් එකකි. 2008 වර්ෂය වන විට එහි දිගුකාලීන නය රුපියල් බිලියන 64ක් වූ අතර එම වසරෙහි පමනක් මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 35කි. එය ඛනිජ තෙල් සංස්ථාව සහ පුද්ගලික විදුලිබල නිෂ්පාදකයන්ට රුපියල් බිලියන 57ක් නය ගැතිය.

ශ්‍රී ලංකා මහ බැංකුව මෑත දී නිකුත් කල වාර්තාවක මෙසේ සඳහන් විය. "ලංකා විදුලිබල මංඩලයේ මෙම දුර්වල මූල්‍ය තත්ත්වය, මෙම ප්‍රශ්නය ඉක්මනින් ම විසඳීමේ වැදගත්කම ඉස්මතු කරනු ලබයි." අතිකාල කප්පාදුව සහ ලංවිම සේවාවන් පිටස්තර ආයතනවලට පැවරීම ඇතුලුව ආන්ඩුව දැනටමත් වියදම් කැපීමේ විවිධ ක්‍රම ක්‍රියාවට දමා තිබේ.

කම්කරුවන්ගේ ඉල්ලීම් සඳහා මොනම අරගලයක්වත් කිරීම ප්‍රතික්ෂේප කල ආන්ඩුවට ගැති වෘත්තීය සමිති එකතුව විදුලිබල පනතට විවෘතව ම සහයෝගය පල කලේ ය. ජවිපෙ විසින් මෙහෙයවනු ලබන වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුන විදුලිබල පනතට විරුද්ධ උද්ඝෝෂනය හිතාමතා ම සීමා කලේ ය.

ජවිපෙ පාර්ලිමේන්තු විරුද්ධ පක්ෂයේ කොටසක් වන නමුත් විදුලිබල මංඩලය හෝ අනෙකුත් ක්ෂේත්‍රවල ආන්ඩුවේ ප්‍රතිපත්තිවලට එරෙහි පූර්න උද්ඝෝෂනයක් දියත් කිරීමේ අදහසක් නැත.

ජනාධිපති රාජපක්ෂ 2005දී බලයට පත්කිරීම සඳහා විවෘතව සහයෝගය දුන් ජවිපෙ විරුද්ධ පක්ෂයේ සිටිය නමුත් යලි ආරම්භ කල ඔහුගේ යුද්ධයට සහය දුන් අතර දැවැන්ත යුද වියදම්වලට ඡන්දය දුන්නේ ය. එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසු ආන්ඩුවට සම්බන්ධවීමේ කොන්දේසියක් ලෙස ජවිපෙ තමන්ගේ ම "ජාතිය ගොඩනැගීමේ ක්‍රියාමාර්ගයක්" යෝජනා කලේ ය.

ආන්ඩුව මොනම සහනයක්වත් දීම ප්‍රතික්ෂේප කර ඇතත් රාජපක්ෂ ඔවුන්ගේ පැත්තේ සිටින බවට අන්තරායකාරී මිථ්‍යාවක් වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුනේ නායකයෝ වගා දිගා කරති. බදාදා කොලඹ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට පිකට් කල කම්කරුවන් අමතමින් වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුනේ කැඳවුම්කරු රන්ජන් ජයලාල් මෙසේ ප්‍රකාශ කලේ ය: "ආන්ඩුව සහ මහජනතාව අපහසුතාවට පත්කරලා අපට ඉල්ලීම් දිනාගැනීමට අවශ්‍ය නැහැ. ජනාධිපතිතුමා හොඳ කෙනෙක් අපට ඔහුව අමනාප කර ගන්න උවමනා නැහැ. ඔහුව බලයට ගෙනාවේ අපි. ඔහු හිටපු කම්කරු ඇමතිවරයෙක්. ඒ නිසා අපි හිතන්නේ නැහැ එයා අපට විරුද්ධවෙයි කියලා."

ආන්ඩුව සමඟ සම්මුතියකට යාමේ මංමුලා සහගත උත්සාහයක යෙදෙමින් ජයලාල් තව දුරටත් පැවසුවේ; "රාජපක්ෂ ජනාධිපතිතුමාගේ අමාත්‍ය මංඩලයට අපගේ හඬ සංනිවේදනය වුනොත් ඉදිරි පැය කිහිපය තුල අපේ ඉල්ලීම්වලට විසඳුමක් ලැබෙයි කියලා මා හිතනවා." ආන්ඩුව ඉල්ලීම්වලට ඇහුම්කන් දුන්නේ නැත්නම් අඛන්ඩ වර්ජනයකට යන බවට බොරු තර්ජනයක් ඔහු කලේ ය. පසුගිය සිකුරාදා වර්ජනයෙන් පසු වෙනත් වර්ජනයක් හෝ කාර්මික ක්‍රියාවක් ගැන වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුන නිවේදනය කර නැත.

ලෝක සමාජවාදී වෙබ් අඩවියට කතා කල කම්කරුවෙකු මෙසේ පැවසීය: "මා බිල්පත් නිලධාරින්ගේ සංගයේ සාමාජිකයෙක්. අපේ වෘත්තීය සමිතිය ඇතුලේ අර්බුදයක් තියෙනවා පනතට සහයෝගය දීම සහ වැටුප් අරගලය සම්බන්ධව. ඔවුන්ගේ කට්ටිවාදී පිලිවෙත මා ඇතුලු බොහෝ කම්කරුවන් අනුමත කරන්නේ නැහැ. පනත සම්මත කරගන්න පුලුවන් වුනෙත් වැටුප් වැඩිවීම දීම ප්‍රමාද කරන්න ආන්ඩුවට පුලුවන් වුනෙත් වෘත්තීය සමිති නායකයන්ගේ මේ කට්ටිවාදය නිසයි.

"අතිකාල සහ අනෙකුත් දීමනාවන් කප්පාදු කිරීම නිසා අඩු වශයෙන් අපේ මාසික ආදායම රුපියල් 10,000-15,000 න් අඩුවෙනවා. සෑම කෙනෙක්ම වගේ නිවාස සහ අනෙකුත් නය අරගෙන තියෙන නිසා අතිකාලවලින් තමයි වියදම් පිරිමහගන්නේ. දැන් අපට මාසික වියදම පියවාගන්න අමාරුයි. ඒ නිසා තමයි වැටුප් වැඩිවීම උවමනා කරන්නේ." ඔහු තවදුරටත් පැවසුවේ ය.

කොත්මලේ විදුලි බලාගාරයේ කම්කරුවෙකු ප්‍රකාශ කලේ; යුද වියදම් සහ ලෝක ආර්ථික අර්බුදය නිසා සල්ලි නැහැ. කියලා ආන්ඩුව කියනවා. නමුත් ඊලඟ අවුරුද්දෙත් ආරක්ෂක වියදම අඩු නොකිරීමට ආන්ඩුව තීන්දු කරලා තියෙනවා. ලෝක අර්බුදය කෙලවර වෙන්නේත් නැහැ. ඒ නිසා ආන්ඩුව ලබන අවුරුද්දෙත් නිදහසට කරුනු විදිහට මේ හේතු ම ඉදිරිපත් කරයි."

කැලනිතිස්ස බලාගාරයේ කම්කරුවෙකු මෙසේ පැවසී ය; "ජවිපෙ සමිතිය වැඩ කරන්නේ ඔවුන්ගේ දේශපාලන උවමනාකම්වලට අනුව. ඔවුන්ගේ ප්‍රතිපත්ති නිසා ආන්ඩුවට පනත සම්මත කරගන්නත් වැටුප් ඉල්ලීම් ප්‍රමාද කරන්නත් පුලුවන් වුනා. යුද්ධය සඳහා දිනක වැටුප පරිත්‍යාග කරන්න ඔවුන් අපව පෙලඹෙවුවා දැන් ආන්ඩුව කියනවා 2009 අපට ලැබිය යුතු හිඟ මුදලත් පරිත්‍යාග කරන්න කියලා."

ඔහු කෝපයෙන් මෙසේ ප්‍රශ්න කලේ ය: "දේශපාලඥයෝ සහ ධනපතියෝ සියලුම වරප්‍රසාද භුක්ති විඳින අතරේ අපි විතරක් මොකට ද පරිත්‍යාග කරන්නේ."